# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

## දෘශ්‍ය කලා සහ සැලසුම්කරණය

**දෘශ්‍ය කලා හා සැලසුම්කරණය ප්‍රවේශය - VIAD 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. කලාත්මක ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමේදී දෘශ්‍ය කලාවේ මූලිකාංග පොදු භාෂාවක් ලෙස යොදාගත හැකි ආකාරය නිදසුන් ඇසුරෙන් පහදන්න.

02. කලාකෘතියක පෘෂ්ඨීය ගුණය හෙවත් වයනය (Texture) එකී නිර්මාණයෙහි කලාත්මක බව කෙරෙහි වැදගත් වන්නේ කවර සාධක මතදැයි යන්න නිදසුන් මගින් පැහැදිලි කරන්න.

03. පර්යාලෝකය (Perspective) පිළිබඳ හැඳින්වීමක් කර දෘශ්‍ය කලාකෘතියක ද්විමානරූපී බව හෝ ත්‍රිමානරූපී බව කෙරෙහි එහි වැදගත්කම පැහැදිලි කරන්න.

04. දෘශ්‍ය කලාවේ භාවිත ප්‍රධාන මූලධර්ම කවරේදැයි හඳුන්වා දී ඉන් ඔබ කැමති අංශ තුනක් තෝරාගෙන නිර්මාණයක සාර්ථකත්වය කෙරෙහි ඒවා ඉවහල් කරගත හැකි ආකාරය විස්තර කරන්න.

05. දෘශ්‍ය කලා කෘතියක ආකෘතිය (form) හා අන්තර්ගතය (content) එහි සාර්ථකත්වය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

06. කලාකරුවකුගේ නිර්මාණයක සාර්ථකත්වය කෙරෙහි එහි ශෛලිය ඉවහල් වන්නේ කෙසේදැයි යන්න නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

07. කලා කෘතියක සමබරතාව (Balance) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? නිදර්ශන සහිතව විමසන්න.

08. සංරචනය (composition) හා රිද්මය (Rhythm) පිළිබඳ අවධානය යොමු කරමින් පහත දැක්වෙන සිතුවම් අගයන්න.

    i. ඒ.සී.ජී.එස්. අමරසේකරගේ "යකැදුරාගේ දියණිය"
    ii. වින්සන්ට් වැන්ගෝගේ "තරු පිරි රැය"

*********************************